*සැ. යු.*- 2018.03.23 දින පළ වූ අංක 2,064 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,065 - 2018 මාර්තු මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2018.03.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 542 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - ජාතික විගණන පනත් කෙටුම්පත 2018 මාර්තු මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 අප්‍රේල් මස 20 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අප්‍රේල් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### රජයේ ඉඩම් ආඥාපනත යටතේ කෘෂිකාර්මික හා වාණිජ කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු පදනම යටතේ ඉඩම් ලබා දීම

1. පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසර පත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරාගැනීමට කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2018.06.25 වැනි දින පෙ. ව. 9.00ට කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියෙන් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) දිස්ත්‍රික්කය : පුත්තලම
(ආ) උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදයම් නිලධාරී කොට්ඨාසය : කරුවලගස්වැව
(ඇ) ග්‍රාම නිලධාරී කොට්ඨාසය හෝ කොට්ඨාස : 638ඒ සාලියවැව, 638බී සාලියවැව, 638සී සාලියවැව, 638ඊ රණවරාපිටිය, 638 පහල පුලියන්කුලම, 638ඩී මූණමල්ගස්වැව, 642ඩී වීරපුර, 642සී දංගස්වැව, 639 ඉහල පුලියන්කුලම, 639බී මැදගම, 639ඒ අලුත්ගම, 639සී පහරිය, 642බී කුඹුක්වැව, 642ඒ රඹාවැව, 642 ඉපලෝගම.
(ඈ) ඉඩම් පිහිටි ගම් : ඉහත ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට අයත් ගම්
(ඉ) ඉඩමේ නම : -
(ඊ) ඉඩමේ පිහිටීම : කරුවලගස්වැව ප්‍රාදේශීය සභා සීමාව තුළ
(උ) අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය : නේවාසික, කෘෂිකාර්මික හා වාණිජ කටයුතු සඳහා
(ඌ) අන්සතු කරනු ලබන ඒකකය : කෘෂිකාර්මික හා වාණිජ කටයුතු සඳහා අක්. 02 සිට අක්. 50 දක්වා

02. 2008/04 චක්‍රලේඛය අනුව රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් ලබා ගැනීම සඳහා ලියාපදිංචි වී ඇති පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත් සළකා බලනු ලැබේ. ඉහත ආදයම් කාණ්ඩයට අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

03. සියලුම ඉල්ලුම්පත්‍ර 2018.06.03 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කරුවලගස්වැව යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතු ය.

04. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2018.06.25 වැනි දින පෙ.ව. 9.00 ට කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට හෝ ඇයට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම ඉල්ලුම්කරුවෙකුම පෞද්ගලිකව පැමිණිය යුතු ය. *නැතහොත්* තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

05. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

06. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් හෝ ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල දී ලබාගත හැක.

i. පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ), පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල
ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කරුවලගස්වැව

ඩී. එම්. කේ. සී. දිසානායක,
පළාත් ඉඩම් කොමසාරිස්,
වයඹ පළාත.

2018 මාර්තු මස 05 වැනි දින දී ය.

ඉල්ලුම්පත්‍රයේ සහ දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘති පහතින් දක්වා ඇත.

**කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ කෘෂිකාර්මික හා වාණිජ කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු පදනම යටතේ ඉඩම් ලබා දීම**

01. සම්පූර්ණ නම :.................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය :.................................................................................

03. (i) ලිපිනය :.................................................................................................

(ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :...................................................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :.................................................................................

04. ගෘහ මූලික අංකය :..............................................................

05. ස්ත්‍රී/පුරුෂ භාවය :..............................................................

06. වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට) :..............................................................

07. උපන් දිනය :..........................................................................

08. විවාහක/අවිවාහක බව :.....................................................

09. රැකියාව :.................................................................................................

10. රැකියාව කරන ස්ථානය :.................................................................................

11. අයදුම්කරු, කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු පවුලේ මුළු වාර්ෂික ආදායම :

| *නම* | *අයදුම්කරුට ඇති සම්බන්ධය* | *රැකියාව* | *වාර්ෂික ආදායම* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම් පිළිබඳ විස්තර :

| *ඉඩමේ නම* | *ප්‍රමාණය* | *අයිතියේ ස්වභාවය* | *හවුල් පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස්* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :.............................................................................................................................................

14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය :.............................................................................................................................
(තමාගේ ද?/බද්දට ද?/අනවසරයෙන් ද? යන වග)

15. නිවස පිහිටි ස්ථානය :...................................................................................

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :.............................................................................

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| *නම* | *වයස* | *ඉගෙනුම ලබන පාසලේ නම* | *ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයේ ණය ලබාගෙන ඇත් ද? එසේ නම් පහත විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :.......................................................................................................................
(ii) ණය ලබාගත් ආයතනයේ නම :.........................................................................................................
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :...........................................................................................................

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් පහත විස්තර සපයන්න :

| *පවුලේ සාමාජිකයාගේ නම* | *ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය* | *ඉතිරි කළ මුදල* |
|---|---|---|
| | | |
| | | |
| | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු, තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව හෙලිවුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

.........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

ඉහත අයදුම්කරු විසින් ඡේද 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද සහතික කරමි.

...........................................,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :—————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :—————.

අනු අත්සන් කරමි.

.............................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

**17 වැනි පරිශිෂ්ඨය (ඉඩම් නියෝග 2017, 02 (IX)**

**දිවුරුම් ප්‍රකාශයයි**

.................................... දිස්ත්‍රික්කය.................................... ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසයේ ........................... ග්‍රාම නිලධාරි වසමේ ............................. පදිංචි .......................................... වන මම, පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ භාර්යාවට සහ වයස අවුරුදු 18ට අඩු මාගේ දරුවන්ට ද, සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1971 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේ ඉහත කී අක්කර ............. රූඩ්................ පර්චස් ............... පමණක් වූ මෙම ඉඩම පවරා ගැනීමෙන්/මිල දී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත්, නිවාස දේපළ උපරිම පනත යටතේ සීමාවන් නොඉක්මවන බවටත් වැඩිදුර මෙයින් ප්‍රකාශ කරමි.

.............................................,
රු. 50.00ක මුද්දරයක් මත
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරුට/කාරියට මෙහි අඩංගු දෑ කියවා, තේරුම්කර දුන් අතර, ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ දී අත්සන් තැබූ බවත් සහතික කරමි.

....................................................,
සමාදාන විනිශ්චයකාරතැන.

03-1062

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.